**මහනුවර කටුගස්තොට ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ, ඉතිරි වැඩ වලට අදාළ ප්‍රසම්පාදන තීරණය**

මහනුවර කටුගස්තොට ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ, ඉතිරි වැඩ වලට අදාළව ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ පුවත්පත් දැන්වීම් පළ කර මිල ගණන් කැඳවන ලදී.

මෙම ව්‍යාපෘතියට අදාළව ලංසු කරුවන් විසින් ඉදිරිපත් කර තිබූ ලංසු ලේඛන ඇගයීමෙන් අනතුරුව මහනුවර කටුගස්තොට ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඉතිරි වැඩ වලට අදාළ කොන්ත්‍රාත්තුව, අවශ්‍ය සියලු සුදුසුකම් සපිරූ LAL CONSTRUCTION AND ENGINEERING SERVICES ආයතනය වෙත රු. 15,902,480.00ක කොන්ත්‍රාත් වටිනාකමකට 2021.07.12වන දින සිට ලබා දීමටත්, කොන්ත්‍රාත් ප්‍රදානය කළ දින සිට දින 120කින් කොන්ත්‍රාත් කාලය අවසන් කිරීමටත් තීරණය කරන ලදී.

නමුත් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ අභියාචනා සලකා බැලීමෙන් අනතුරුව මහනුවර කටුගස්තොට ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ, ඉතිරි වැඩ වලට අදාළව නැවත වරක් මිල ගණන් කැඳවීමට තීරණය කරන ලදී.

**චන්ද්‍රරත්න පල්ලේගම**
අතිරේක ලේකම් (පාලන හා ප්‍රසම්පාදන)
ලේකම් වෙනුවට